# අපූරු ගමන



ඔනාදි තිසාමා නවරත්න

# අපූරු ගමන

ඔනාදි තිසාමා නවරත්න

# අපූරු ගමන

ඔනාදී තිසාමා නවරත්න

99B/2 උඩ ඊරියගම, පේරාදෙණිය.

**චිත්‍ර**

ඔනාදී තිසාමා නවරත්න

**ISBN 978-624-206-666-0**

**කතෘගේ වෙනත් කෘති**

- ලොකුම වැරැද්ද
- ඔලීනාට තෑග්ගක්
- ඔල්ගා ගේ සිහිනය
- Mother Earth smiled at Olumalee
- Enchanted Present
- Little Olga's dream

**ප්‍රකාශක** - මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

**කෘතිය එළිදක්වන දිනය** 2023-11-15

# පිදුම

මගේ සියලු දුක සැප

බලන

ආදර අත්තම්මාට

මෙම පොත

පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන  ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින්  අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත්  මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ  ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයප්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි  ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින දිවිය දිනන  විද්‍යුත්  පොතක් ව්‍යාපෘතිය  හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන  විද්‍යුත්  පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය  ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම  නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.


ශෂිකලා සේනාධීර  
විදුහල්පතිනිය  
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර  
**2023 . 11 . 01**

මෙ ගෙවෙන්නේ 5023 වර්ෂය යි. මේ කාලය වන විට පෘථිවිය සහ ඕසෝන් ආරක්ෂණ පද්ධතියකට යටත් ව ජීවය පවත්වා ගන්නට සමත් වී සිටියේ විද්‍යාඥයන්ගේ දැනුමට පින්සිදු වන්නට යි.

ඕසෝන් ආරක්ෂණ පද්ධතිය යටතේ නිර්මාණය කළ ඕසෝන් බුබුළ මගින් හිරුගේ අයහපත් කිරණ පෘථිවිය මත පතිත වීම වැළැක්වී ය. පෘථිවිය කරා ඇදී එන ඇස්ට්‍රොයිඩ රේඩාර් භාවිතයෙන් හඳුනාගෙන ඒවා ලුහුබැඳ ගොස් විනාශ කිරීමට සමත් දිගුදුර අභ්‍යවකාශ ආරක්ෂණ පද්ධතියකින් ඕසෝන් බුබුළ සවි ගන්වා තිබිණි.. ඉතා විශාල මකුළු දැලක් සේ මේ සහ ඕසෝන් බුබුළ පද්ධතිය පෘථිවිය වසා පැතිරී පෘථිවිය ආරක්ෂා කළේ ය.

මේ නිසා මේ කාලය වන විට ලෙඩ රෝග වලටත් ස්වභාවික අනතුරු වලටත් ගොදුරු වී මිලියන ගණනක් මිය ගිය ද ඉතිරි වූ අයට ඉතා හොඳ ආරක්ෂාවක් ඇති වී තිබිණි.

ඕල් වයස අවුරුදු දොළහක  පිරිමි ළමයෙක් වූවේ ය. ඔහුගේ නංගී ඔහුට වඩා අවුරුදු පහක් බාල වූ අතර ඔවුන්  සීයා ආච්චි මෙන් ම ලොකු මාමාත් සමඟ එක ම නගරයක විසීමට වාසනාවන්ත වූහ.



ඔවුන්  ප්‍රවාහනය සඳහා අතිනවීන කැප්සියුල  භාවිත කළහ. නගර අතර ගමන් කිරීමත්  රටවල් අතර ගමන් කිරීමත් සිදු වූයේ විසබීජ විනාශ කරන කවුළු හරහා යි.

මේ ඔක්තෝබර් මාසය යි. ඔක්තෝබර් මාසය සාහිත්‍ය සඳහා වෙන් කර තිබිණි. ඕල්ට පැවරී තිබුණේ ඉතිහාසය ගැන කරුණු සෙවීමේ ව්‍යාපෘතිය යි. හැකි තරම් කරුණු සොයා හොඳ ව්‍යාපෘතියක් කිරීමට ඕල් සිතා ගත්තේ ය.

ඕල් ගේ සීයා විසුයේ ඔහුගේ නිවසට යාබද පාරේ අනෙක් පැත්තේ නුවර වැව පෙනෙන මානයේ නිවසක යි. ඕල් සීයා හමුවන්නට සිතුවේ ඔහු ගෙන් ඉතිහාස කරුණු අසා ගැනීමේ අරමුණෙනි.

“ අම්මේ මම සීයලාගේ ගෙදර ගිහින් එන්නම් “ යි මවට පැවසූ ඕල් තම නිල් පැහැ කැප්සියුලය ට නැගුණේය.

ඔහුගේ සිතැඟි හඳුනා ගත් කැප්සියුලය ස්වයංක්‍රීයව එසැනින් සීයාගෙ නිවස දෙසට ඇදී ගියේ ය.

වැව් කණ්ඩිය ළඟ අනෙක් පසට හැරී සිටින සීයාව ඕල්ට දැකගත හැකි විය. නුවර වැවේ හමායන පවන් රැල්ලෙන් තම ගිමන් නිවා ගනිමින් සීයා අපමණ ආස්වාදයක් ලබනවා නොවේදැ යි ඕල්ට සිතිනි.

“ සීයා ඇවිදින්න ආවා ද? “ ඕල් සීයා අසලින් වැව් කණ්ඩිය මත වාඩිවෙමින් නිහඬතාව බිඳිමින් ඇසුවේය.

“ ආ.... ඕල් මොකද පුතා මේ පැත්තේ? “ ඕල් වෙත හැරුණු සීයා පැහැදිළි හඬින් ඇසුවේ ය.

සීයාට වයස අවුරුදු අනූ පහක් වුව ද ඔහු සිතිනුත් කයිනුත් දුබල ව නැත. නවීන සෞඛ්‍ය විසඳුම් සොයා ගෙන ඇති නිසා දීර්ගායුෂ ලැබීමට මිනිසා වරම් ලබා තිබිණි. සීයගෙ ස්මරණ ශක්තිය ඉතා යහපත් මට්ටමක තිබූ නිසා ඕල් නිතර නොයෙකුත් විෂයන් ඔහු සමඟ සාකච්ඡා කළේ ය.

“ සීයා මොකද හිතන්නේ අපේ ඉතිහාසය ගැන?“ ඕල් සීයාගෙන් ඇසුවේ ය.

“ හ්ම්.... ඕල්..., කාලය ගත වෙන්න වෙන්න මිනිසකු කොතරම් වෙනස්කම්වලට භාජනය විය හැකිද? “ සීයා උගුර පැහැදිලි කරමින් ලොකු කතාවකට මුලපිරුවේ ය.

පෘථිවිය මත හටගත් පළමු ජීවියාගේ පටන් ක්‍රමක්‍රමයෙන් සාගර ජීවීන් ද ඊට පසුව ගොඩබිම වෙසෙන ජීවීන් ද හට ගත් අයුරු සාකච්ඡා කළ ඔවුන් වානරයාගෙන් බිහිවුණු මිනිසාගේ පරිවර්තනයන් ද සාකච්ඡා කළහ. සාකච්ඡා කරන කරුණු ගොනු කර ගැනීමට ඕල් තම අත් පළඳනාව ක්‍රියාත්මක කළේය.

“ සීයේ, ඇත්තට ම අපට කාලය හරහා යන්න පුලුවන් ද? “ ඕල්ගේ හිතේ තිබුණ ලොකු ම ප්‍රශ්නය ඔහු සීයාගෙන් ඇසුවේ ය.

“ අපට පුලුවන්නම් කාලයට වඩා වේගයෙන් ගමන් කරන්න නැත්නම් කාල කුහරයේ රහස සොයා ගන්න එය කරන්න පුළුවන් ” සීයා සිනාසෙමින් කීවේ ය.

“ සීයේ කාලය හරහා යන කුහරය ඇත්ත ද බලන්න මට ආසයි” ඕල් කලක සිට සිතට නැගී තිබූ අදහස සීයාට පැවසීය.

දඹරැඟිල්ලෙන් නළලට තට්ටු කරගත් සීයා ටික වේලාවක් කල්පනා කළේ ය.

“ ඔව් ඒ ගැන ගොඩක් කතා නම් තියෙනවා “ යි සීයා අහස දෙස බලමින් කීවේ ය.

අතීතයේ වෙන් වෙන් ව තිබුණු ගොඩබිම් මේ කාලය වනවිට ක්‍රමයෙන් ඈඳී ගොඩබිම් තුනක් නිර්මාණය වී තිබිණි. ඒවා උතුරු , නැගෙනහිර හා බටහිර වශයෙන් ඔවුන් නම් කළහ.

මේවායෙන් මිනිස් වාසයට තෝරාගෙන තිබුණේ උතුරු හා නැගෙනහිර ගොඩබිම් පමණි. බටහිර ගොඩබිම කඳු වැටි බහුල මිනිස් වාසයට නුසුදුසු ගොඩබිමක් ලෙස සලකා ඊට ඇතුළු වීමට විශේෂ අවසර තරංග ලබාදීමට කටයුතු යොදා තිබිණි.

කාල කුහරය තිබෙන්නේ බටහිර ගොඩබිමේ බව සීයාට මතක් විය.

“ කාල කුහරය තියෙනවා කියන්නේ බටහිර පැත්තේ ” සීයා ඕල්ට මතක් කළේය.

“ අපිට බටහිර ගොඩබිමට යන්න පුලුවන් ද? “ ඕල් ඇසුවේ ය.

“ මමත් කවදා හරි යන්න හිතපු තැනක් ළමයො, අපිට විශේෂ අවසර තරංග නම් ගන්න වේවි “ යි පැවසූ සීයා ඔහුගේ ස්වයංක්‍රීය තිරය ළඟට ගත්තේය.

“ අපි ලොකු මාමාගෙනුත් අහමු” යි ඕල් කිව්වේ ලොකු මාමා ගොඩබිම් අතර ගමන් කර ඇති බව මතක් වූ නිස යි.

“ අපි ලොකු මාමාටත් එන්න කියමු. මම කතා කරන්නම්. විශේෂ අවසර තරංග ලොකු මාමා ගනීවි” යි පැවසූ සීයා තම ස්වයංක්‍රීය තිරය හා සම්බන්ධ වී කාල කුහර බැලීමට යන ගමන තව දවසකින් යාමට ලොකු මාමා සමග කතා කරනවා ඕල් සතුටින් අසා සිටියේ ය.

වගකිව යුතු කාර්යයන් සමග නිතර ම කාර්යබහුල වන ලොකු මාමාත් මේ ගමනට එක පයින් කැමැති වූවේ ය.

තමන් දන්නා විදියට දිනකට විශේෂ අවසර තරංග දහයක් පමණක් නිකුත් කරන බව ඔහු කීවේ ය. ලොකු මාමාගෙන් නො දන්නා ඉතිහාස කරුණු අසා ගැනීමට ඕල් සිතා ගත්තේ ය.

කතා කරගත් පරිදි දිනකට පසුව උදාවූ උදෑසන  සීයත් ලොකු මාමාත් සමඟ ඕල් සීයාගේ කැප්සියුලයට නැගී නැගෙනහිර ගොඩබිමෙන්  පිටවී බටහිර ගොඩ බිම කරා ගමන් කළේ ය.

ආරක්ෂක මුර කුටිවලින් ඔවුන්ගේ ශරීරවල තිබුණු විසබීජ විනාශ කර අවසර තරංගය ද පරීක්ෂා කරන ලදී.

බටහිර ගොඩබිම කඳු පල්ලම් බහුල ජීවය දුලබ බිමක් බව ඕල් දුටුවේය. ගල් කඳු පේලියකට පසු ළඳු කැලෑවක් ඔවුන්ට හමුවිය.


" තව කඳු පේලි දෙකක් පසු කරන්න ඕන " ලොකු මාමා නිවැරදි සිතියම් තිරය බලා කීවේ ය. ආපසු යන කැප්සියුල දෙකක් ද ඔවුන්ට හමුවිය.

කඳු  පේලි දෙක පසු වීමෙන් අනතුරුව ළා කොළ පැහැති බිමක් දක්නට විය. ළා කොළ  පැහැති බිම පසුකරනවාත් සමඟ නිල් පැහැ වැලි පසක් වූ බිමක් ඔවුන්ට හමුවිය.  ක්‍රමයෙන් නිල් පැහැ වැලි පස දම්පැහැති බිමක් දක්වාත් දම්පැහැති බිම ළා රෝස  පැහැති බිමක් දක්වාත් පැතිරිණි.

අතරින් පතර කැළෑ මල් පඳුරු තිබූ නිසා මේ බිම සුරංගනා ලොවක් සේ ඕල්ට පෙණිනි. ඔහුට පසු ගියදා දුටු උතුරු එළිවල සුන්දරත්වය සිහි වුනේ ය.
ටික දුරකින් විශාල සිප්පියෙක් බඳු වූ ගල් පරයක් මතු වී ඇති බව ඔවුන්ට පෙනුණි. මෙය කාල තරණ දොරටුව දැයි ඕල් විපරම් කළේ ය.

" ඕල්, අර තියෙන්නේ කාල තරණය කරනවා කියන දොරටු විවර යයි" ලොකු මාමා ඕල් ගේ සැකය දුරු කළේය.

" කැප්සියුලය නැවැත්වීමට සුදුසු තැනක් බලන්න " කියමින් සීයා කැප්සියුලය ගොඩබෑස්වීමට සුදුසුතැනක් සෙව්වේ ය.



කාල කුහරයට මදක් ඉදිරියෙන් හොඳින් වැඩුණු මල් පඳුරක් ළඟ කැප්සියුල නැවතූ ඔවුන් කාල තරණ දොරටු විවරය නැරඹීමට ඒ අසලට ගිය හ.

“ පෘථිවියේ චුම්භක ශක්තිය අඩුම තැන පිහිටා තියෙන්නෙ මෙතන ලූ” ලොකු මාමා අසල වූ තිරය කියවා ඕල්ට පැහැදිලි කළේය.

“ නොදන්න දේ අල්ලන්න නම් එපා “ සීයා ඕල්ට අනතුරු ඇඟවූයේ මෙතැන සිදු වන දේ දැන නො සිටි බැවිනි.

කාල කුහරය පරිහරණය කරන ආකාරය ගැන කිසිම සටහනක් ඔවුන්ට හමු වූයේ නැත.

“ ඇත්තට ම මෙතන නම් සුරංගනා ලොවක් ම තමයි. මේ සිප්පි කුහරය ඉතාම සිනිඳුයි. මුහුණ පෙනෙන තරමට ම පැහැදිලියි “ ඕල් තමාටම කියා ගත්තේ ය.

ඉදිරියේ තිබුණු කුඩා කුහර තුන පසුකරමින් ගිය ඕල්ට එකිනෙකට සමාන්තරව නිර්මාණය වී තිබුණු කණු රාශියක් දැකගත හැකි විය.

කණු අතරින් රිංගූ ඔහු කුඩා වේදිකාවක් දුටුවේ ය. වේදිකාවට නැග ගත් ඕල් සිප්පි විවරය බැලීමට උඩ බැලුවේ ය.

හරිම පුදුමයකි සිප්පි පියන අතරින් මනස්කාන්ත නිල් අහසක් ඔහුට දර්ශනය විය.

" සීයේ......මේ බලන්න.... මෙතන අහස හරිම ලස්සනයි, මම කවදාවත් මේ තරම් ලස්සනට අහස දැකල නම් නෑ" යි කියමින් ඕල් සීයාට කතා කළේය.

"සී... යේ..... සී........ යේ.......... ඔයා... කො... හේ.... ද?"

සීයත් ලොකු මාමා පෙනෙන්නට නැත. ඕල් තව ටිකක් සෝදිසි කළේ ය.

" සී...... යේ..... ලොකු මා.....මා ..... ඔයාලා කො..හේ...ද.....?" ඕල්ගේ සිතට ලොකු අපැහැදිලි බවක් දැනෙන්නට විය.



සිප්පි කුහරයේ වේදිකාවට නැගී සිදුරෙන් බැලුවේ ඕල් පමණි. ඔහු සිප්පි කුහරයෙන් එළියට පැමිණ වට පිට බැලුවේ ය. හරිම පුදුමයකි. ඔවුන් පැමිණි කැප්සියුලය නැවතූ තැන එය නැත. සරුවට වැඩුණු මල් පඳුර ද අතුරුදන් වී තිබිණ.

රෝස පැහැයෙන් දිලිසුන වැලි පොළොව අතුරුදන් වී දුඹුරු පැහැ පස් සහිත තද කොළ පැහැති තණ කොළ වලින් වැසුණු සරුසාර බිමක් ඕල් ඉදිරියේ මැවී තිබිණි.

කිසියම් ආශ්චර්යමත් දෙයක් සිදු වී ඇති බව ඕල්ට දැන්නම් හොඳින් ම දැනෙන්නට විය. හිතට දැණුනු බය නිසා ම ඔහු සිටි තැනම බිම හිඳ කල්පනා කළේය.

" ම්...ම්...ම්... එහෙනම් මෙහෙ ඕසෝන් බුබුළ නැතුව ඇති, ඒ නිසයි අහස මේ තරම් පැහැදිලි" ඕල් තමාට ම සෙමෙන් කියා ගත්තේය.

අවට පරිසරය බැලීමට ඔහුගේ පුංචි සිතට බිය මුසු ආශාවක් ඇති වූ නිසා ඔහු නැගිට වටපිටාව විපරම් කළේය.

හොඳින් පැසුණු ගෙඩි පිරුණ අඹ ගසක් ඔහු ඉදිරියේ විය.

" මෙතරම් අඹ ගෙඩි " ඔහුට පුදුම සිතිනි.

පුංචි කුරුල්ලෝ දෙදෙනෙක් අඹ අතු අතරින් පියඹා ගියහ. ලේනෙක් අඹ අත්තක් දිගේ දිව ගියේ ය.

" ඉදුණු අඹ සුවඳක් දැනිලා වෙන්ඩ ඇති" යි ඕල්ට සිතිනි.

ඔහු ඉදිරියේ අඩිපාරක් විය. අඩිපාර දිගේ ඕල් ඉදිරියට ම ඇවිද ගියේ ය. අවට පරිසරයෙහි සිරි නරඹමින් යද්දි පසෙකින් ගලා බසිනා අලංකාර පුංචි ඔයක් ද ඔහුට හමු විය.

තවත් ටික දුරක් යද්දි ඈත කඳු පාමුල කුඩා නිවසක් තිබෙන බව ඔහු දුටුවේ ය. එපමණකුදු නොවේ, කුඩා ළමුන් තිදෙනෙකු ඔයට පැන සෙල්ලම් කරන බව ඕල් හොඳින් දුටුවේ ය.

" මේ ඔයේ වතුර හරිම පැහැදිලියි" ඔහුටත් ඔයට බැසීමට ආසා සිතිනි.

ඔහු සෙමෙන් බූට් සපත්තු යුගලය ගැල වූ අතර ඒවා පරිස්සමට ඔය අයිනේ වූ කුඹුක් ගස යටින් තැබුවේ ය.



ගල් අතරින් ගොස් ඔයට කකුල් දෙක ඔබාගත් ඕල් ජලයේ සිසිල් පහසින් අසීමිත ආස්වාදයක් ලැබුවේ ය.

ටික වෙලාවක් එසේ සිටි ඔහුට කුඩා ළමුන්ගේ කිචි බිචි සිනා හඬ ඉතාම ආසන්නයෙන් ඇසෙන්නට විය. ඕල්ගේ ඇඟේ ගෑවි නො ගෑවී දිවගිය ළමුන් ඔයට පැන අඹ ගෙඩි සෝදන්නට වූහ.

ඔහු වහා වතුරෙ ඔබාගෙන සිටි දෙකකුල් ගොඩට ගෙන ජලය පිසදා ගැනීමට සූදානම් වූවේය. තම කුඩා ලේන්සුව ගෙන ජලය පිස දැමීමට සිතුව ද පුදුමයකි, ඕල්ගේ කකුල්වල ජල බිඳුවකුදු ගෑවී තිබුණේ නැත.

බූට් සපත්තුව අතට ගත් ඔහු දුටුවේ එහි ද කිසිදු මඩ පැල්ලමක් නොමැති බවයි. ඔහු තවත් විපරම් කළේ ය.

මෙවර ඔහු දුටුවේ ඔහුගේ පා සටහන් පොළොව මත සටහන් ව නැති බව යි.

" එහෙනම් මේ පුංචි ළමයින්ට මාව පේන්නෙත් නැතුව ඇති" ඕල්ට සිතිනි.

තමා අතීතයේ කිසියම් කාලයකට කාල තරණය කර ඇති බව ඕල් දැන සිටියේ ය. එහෙත් කුඩා ළමයින්ගේ සතුට පිරුණු ලෝකයට යාමට නො හැකි බව හැඟුණ විට පුංචි ඕල්ගේ ඇසට කඳුළු බිඳුවක් ඉනුවේ ය.

" මොනවා උනත් අතීතයේ සුන්දරත්වය විඳීමට මට පුළුවන්" යි සිතමින් ඕල් නැවතත් ඔහුගේ දෙකකුල් ඔයේ සීතල වතුරේ ඔබා ගත්තේ ය.

ඒ වගේ ම ඔහු තේරුම් ගත් වැදගත් ම කරුණ වූයේ අතීත ලෝකය වින්දනය කළත් එය වෙනස් කිරීමට තමාට මෙහිදී අවකාශ සලසා නැති ඉතා වටිනා කාල යන්ත්‍රයක් ඔවුන් නිපදවා ඇති බවයි.



" ඔව්,... අතීතය තියන විදිහට ම තියෙන්න ඕන, ඒ අපේ ම අතීතය යි" කඳු මුදුන දෙසට දිව යන ළමුන් දෙස එක එල්ලේ බලා සිටි ඕල් කීවේ ය.

ආපසු හැරුණු ඔහු සිප්පි කුහරය දෙසට ඉක්මන් ගමනින් ගියේ නැවතත් අනාගතයේ තම ලෝකයට ගොස් ඔහු සොයාගත් අපූරු කරුණු සීයාටත් ලොකු මාමටත් කීමට තිබුණු හදිස්සිය නිසයි.

ආපසු හැරුණත් මෙවර ඔහු ඉදිරියෙන් තද කළු පැහැති ඉතා විශාල සතුන් රාශියක් ගමන් කරමින් සිටිය හ. අතීතයේ විසූ බව පැවසෙන අලි රංචුවක් තමා ඉදිරියෙන් ගමන් කරනා බව ඕල් ඉක්මනින් ම හඳුනාගත්තේ ය. ඔහු අලින්ගේ හැඩහුරු වත් හැසිරීමත් හොඳින් නිරීක්ෂණය කළේ ය. අලි අම්මා තම පැටවා ආරක්ෂා කරන ආකාරය ඔහු හොඳින් බලා සිටියේ ය.

" අම්මගේ ආදරේ හැමදාමත් එක වගේ" නොවේදැයි ඕල්ට සිතිනි.

" අතීතයට ආවා නම් ආයෙත් යන්න මගක් ඇති" යි සිතමින් ඕල් සිප්පි කුහරය තිබූ තැන සෙවීය.

ගස් වැල් වලින් වැසී තිබුණු සිප්පි කුහරය සොයාගැනීමට ඔහුට දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුවිය.

ඕල් ඉදිරියෙන් ම තිබුණු කුහර තුනක් අතරින් රිංගමින් අනාගතයට යන මග සෙවීය. නමුත් ඔහු තවමත් අතීතයේ සිටියේ ය.

අවසානයේ ඔහු කැලෑ වැල්වලින් වැසී තිබුණු සිප්පි කුහරයේ කණු සොයාගත්තේ ය. කණු අතරින් රිංගා කුඩා වේදිකාවට ගොඩ වූ ඔහු හොඳ හුස්මක් ගෙන මීට පෙර කළ ආකාරයට ම කුහර විවරය බැලීමට උඩ බැලුවේ ය.

පුදුමයකි, මෙවර ඕල් දුටුවේ වෙනදාට ඔහු දකින සන ඕසෝන් ස්ථරය සහිත අහස යි. එහි මළානික සුදු පැහැය දුර්වල වූ ප්‍රාණයක් වගේ නේදැයි ඕල්ට සිතුනේ ඔහු මීට ටිකකට කලින් ප්‍රාණවත් නිල් අහස දැක සිටි නිසයි.

" හ්ම්.... එහෙනම් පෘතුවියක් වයසට යනවා" නොවේදැයි ඕල්ට සිතුනි.

ක්ෂණිකව වටපිට බැලූ ඕල් කැප්සියුලය ළඟ බිම වාඩිවී සිටි සීයාත් ලොකු මාමාත් දුටුවේය.

" එහෙනම් මම ආයෙත් ආවා" සතුටින් ඉපිලී ගිය ඕල් කෑ ගැසීය.

" සීයේ, ලොකු මාමේ මං ආ.... වා..... කාල තරණය කරලා එන්න මට පුළුවන් වුණා" යි ඕල් උඩ පනිමින් කෑගසන්නට වූයේ නැවත ඒමට නොලැබේවි කියා සිතේ තිබූ බියත් දැන් පහව ගිය නිසයි.

" ඕල්, ... ඔයා කාල තරණය කළා ද?" සීයා ඕල් දෙසට එබී කුතුහලයෙන් ඇසුවේ ය.

" ඔහු සීයේ..... මම අතීතයට ගියා, මම ගොඩක් ලස්සන අතීත කාලයකට ගියා" කැප්සියුලයේ ජනෙල් පළුවකින් එබුණු ඕල් සීයාටත් ලොකු මාමටත් අතීතයට ගිය ආකාරය විස්තර කරන්නට පටන් ගත්තේ ය.

සිප්පි කුහරයේ විවරය බැලීමට උඩ බැලූ පසු කාල කුහරයේ දොරටුව විවර වූ බව ඔහු කීවේය.

ජලයේ සිසිල් පහස ලැබුව ද ජල බින්දුවක්වත් ගෙන ඒමට බැරි බවත් තමන්ගේ පා සලකුණු පොළොව මත සටහන් නොවූ බවත් ඒ වගේ ම එහි ජීවත් වෙන අයට තමාව දර්ශනය නොවූ බවත් ඕල් එක හුස්මට කියාගෙන ගියේ ය. සියාත් ලොකු මාමාත් ඕල්ගේ කතාවට බාධා කළේ නැත.

"එහෙනම් ඔවුන් ඉතා හොඳ කාල යන්ත්‍රයක් නිර්මාණය කරලා තිබෙන හැඩයි" කැප්සියුලය ට ගොඩවෙමින් ලොකු මාමා කීවේ ය.

"අපි තවත් දවසක ආයෙත් එමු" ඕල් වෙත නැඹුරු වුණු සීයා ඔහුගේ උරහිසට තට්ටුවක් දමා කීවේ ය.

සිප්පි කුහරයෙන් කාල තරණය කොට අතීතයට යාම විසිතුරු සිහිනයක් මෙන් ඕල්ට දැණුනි.



" ඔව් ඒ අතීතය ඒ විදියට ම තියෙන්න ඕන ඒ අපේ ම අතීතය යි" පවසමින් ඕල් කැප්සියුලයට ගොඩ වුණේ අත් පළඳනාවේ තැන්පත් කරගත් කරුණු යොදා තම ඉතිහාස ව්‍යාපෘතිය නිමකිරීමට සිතමිනි.

කඳු මුදුනට දිව ගිය ළමුන්ගෙ මතකය ඕල්ගේ සිත තුළ සැමදා නො සිදෙන සතුටක් ඉතිරි කළේ ය.

නිමි.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
**2023 . 11 . 01**